www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තුවක්කුකරුවෝ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ දෙමල මාධ්‍යවේදියකු ඝාතනය කරයි

## Gunmen kill prominent Tamil journalist in Sri Lanka

**නන්ද වික්‍රමසිංහ විසිනි**

**2005 මැයි 6**

පසුගිය සතියේ දී කොලඹ දී ඝාතනය කෙරුනු ප්‍රසිද්ධ මාධ්‍යවේදියකු වූ ධර්මරත්නම් සිවරාම්ගේ අවමගුල, සඳුදා නැගෙනහිර පලාතේ මඩකලපුවේ දී පැවැත්වුනි. සිවරාම්, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට පක්ෂපාතී වෙබ් අඩවියක් වන *ටැමිල්නෙට්* කර්තෘ මන්ඩලයේ ජ්‍යෙෂ්ට සාමාජිකයෙක් හා ශ්‍රී ලංකාවේ දිනපතා පුවත්පතක් වන *ඩේලි මිරර්* පත්‍රයට දෙමල ගැටලු ගැන ලියන ලේඛකයෙක් ද විය. පැහැදිලිව ම දේශපාලනිකව මෙහෙයවුනු ඔහුගේ ඝාතනය රටේ වාර්ගික ආතතීන් උත්සන්න කර තිබේ.

46 වියැති සිවරාම් අප්‍රේල් 28 දා රාත්‍රී 10.30ට පමන කොලඹ අගනුවර බම්බලපිටියේ දී පැහැර ගෙන යන ලදි. ඉන් පැය දෙකහමාරකට පසුව, අගනුවරට යාබද පෙදසක, ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු සංකීර්නයට මීටර් 500ක් පමන දුරින් පිහිටි ස්ථානයක දී ඔහුගේ සිරුර සොයා ගැනුනි. පශ්චාත් මරන පරීක්ෂනය සිදු කල අධිකරන වෛද්‍ය විශේෂඥ ජීන් පෙරේරා වාර්තා කලේ, සිවරාම්ගේ හිස පිටුපසට හා උරහිස්වලට පහර දෙනු ලැබ සමීපයේ ම සිට ඔහුට වෙඩි තබා ඇති බවයි.

සිවරාම් සහ තවත් කිහිපදෙනකු මුන ගැසුනු ආපන ශාලාවක් අසල පුද්ගලයන් දෙදෙනෙකු ගැවසෙමින් සිටි බව ඇසින් දුටුවෝ පොලීසියට හා මාධ්‍යවලට පැවසූහ. ඔහු එතැනින් නික්ම යන විට, රිදී-අලු පැහැති ඉන්ටර්කූලර් රථයක් ඔහු සමීපයට පැමිනි අතර මිනිසුන් දෙදෙනෙක් ඔහුව ඔසවා රථය තුලට දමා ගත්හ. මේ සියල්ල සිදු වූයේ බම්බලපිටිය පොලිස් ස්ථානය ආසන්නයේ දී ය. ඔහුගේ සිරුර විසි කර තිබුනේ නිරන්තර පොලිස් මුර සංචාරවලට ලක් වන අධි ආරක්ෂක කලාපයක් තුල ය.

ඇගේ සැමියා පැහැර ගෙන ගිය බවට නිර්නාමික දුරකතන ඇමතුමක් ලැබීමෙන් පසුව, සිවරාම්ගේ බිරිඳ යෝගරංජනී ධර්මරත්නම් පෙරවරු 1.00ට බම්බලපිටිය පොලීසියේ පැමිනිල්ලක් දැම්මා ය. ඔහුගේ සිරුර සොයා ගනු ලැබුවේ ද දල වසයෙන් එම වේලාවේ දී ය. පොලීසිය සිද්ධිය පිලිබඳව සෙවීමට පරීක්ෂන කන්ඩායම් දෙකක් පත් කොට ඇතත් කිසිදු වැදගත් හෝඩුවාවක් සොයා ගෙන නැත.

ශ්‍රී ලංකාවේ මාධ්‍ය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඇතුලු මාධ්‍යවේදී සංවිධාන මෙන් ම මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමේ කමිටුව සහ දේශ සීමා නොමැති මාධ්‍යවේදීන් යන සංවිධාන ද මෙම ඝාතනය මාධ්‍ය නිදහසට එරෙහි ප්‍රහාරයක් ලෙස හෙලා දැක ඇත. මාධ්‍යවේදීහු අඟහරුවාදා කොලඹ නගර මධ්‍යයේ පිහිටි කොටුව දුම්රිය පල අසල පිකට් උද්ඝෝෂනයක යෙදෙමින් ඝාතනයට විරෝධය පල කලහ.

මෙම සිද්ධිය සම්බන්ධ සැකකරුවන් ගනනාවක් ම සිටී. විවිධ සිංහල අන්තවාදී සංවිධාන සහ ආරක්ෂක හමුදාවෝ ම එල්ටීටීඊයට විවෘතව සහානුමතියක් පල කරන ඕනෑම අයකු යුක්තියුක්ත ඉලක්කයක් ලෙස සලකති. රටේ 20 අවුරුදු සිවිල් යුද්ධය තුල දී, දහස් සංඛ්‍යාත දෙමල ජාතිකයන් "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස කිසිදු නඩු විභාගයකින් තොරව හිතුමතේ රඳවා ගෙන සිටි අතර සමහර අවස්ථාවන්හි දී ඔවුහු වධ බන්ධනයන්ට ද ලක් කෙරුනි. පොලීසියේ හා මිලිටරියේ මෙන් ම ඒවා හා බැඳුනු පැරා-මිලිටරි කන්ඩායම්වල කොටස් සහ ස්වෝත්තමවාදී කල්ලි පැහැරගෙන යාම් හා ඝාතනවලට සම්බන්ධිත ය. සිවරාම් අල්ලා ගෙන ඝාතනය කල ආකාරය මගින් පෙන්නුම් කෙරෙන්නේ එහි සැලසුම් සහගත බව හා අත්දැකීම් සහිත බව යි -- එනම් වෘත්තීයමය ක්‍රියාවකි.

පාර්ශ්වීය භාවය සම්බන්ධයෙන් කුප්‍රකට කොලඹ පුවත්පත්වලට පවා, ශ්‍රී ලංකාවේ ආරක්ෂක හමුදාවන් මෙයට සම්බන්ධ විය හැකැයි යන්න වක්‍රාකාරයෙන් පිලිගැනීමට බල කෙරුනි. සඳුදා *ඩේලි මිරර්* පත්‍රයේ කතුවැකියක් මෙසේ සඳහන් කලේ යː "අපට කීමට ඇත්තේ මෙපමනයිː මෙම බියගුලු ක්‍රියාවට රාජ්‍ය බල හස්තයක යම් ආකාරයක නිහඬ සහයෝගයක් ලැබුනේ නම් අප ඔවුන්ට මතක් කිරීමට කැමති වන්නේ, රාජ්‍යයෙන් වැටුප් ලබන කිසියම් අයකු සන්නිවේදකයකු ඝාතනය කිරීමෙන් එල්ටීටීඊය වැනි ත්‍රස්තවාදී සංවිධානයක මට්ටමට පල්ලම් බැසීම සම්බන්ධයෙන් කිසිවකුගේ සමාව නොලැබෙනු ඇති බවයි."

සිවරාම් කිහිප වතාවක් ම පොලීසියේ හා නාඳුනන කල්ලිවල හිරිහැරයන්ට ලක්ව තිබුනි. 1996 දී රටේ බල පැවැත්වූ රුදුරු හදිසි නීති රෙගුලාසි යටතේ ඔහු අත්අඩංගුවට ගන්නා ලදි. එහෙත් සාක්ෂි නොමැති බැවින් ඔහුව නිදහස් කිරීමට පොලීසියට සිදු විය. 2001 ජූනි මස නාඳුනන කල්ලියක් ඔහුගේ නිවසට කඩා වැදීමට උත්සාහ කලේ ය. මෙම කඩා වැදීම සිදු වූයේ ඔහු "කොටියකු" ලෙස, එනම් එල්ටීටීඊ සාමාජිකයකු ලෙස, හංවඩු ගැසූ ලිපි දෙකකට -- සිංහල වර්ගවාදී දිවයින පත්‍රයේ සහ රජයට අයත් තිනකරන් පත්‍රයේ -- පසුව වීම අර්ථභාරී ය. පසුගිය වසරේ මැයි මස ඔහු නොමැති අවස්ථාවක පොලීසිය ඔහුගේ නිවසට කඩා පැන පුපුරන ද්‍රව්‍ය හා ඔහුට අපරාධ චෝදනා නැගිය හැකි වෙනත් සාක්ෂි සෙවී ය. ඔවුහු කිසිවක් සොයා ගැනීමට අපොහොසත් වූහ.

සිවරාම් ඝාතනය සිදු වූයේ හිර වී ඇති සාම සාකච්ඡා යලි ඇරඹීමේ ප්‍රයත්නයන්ට එරෙහිව සිංහල අන්තවාදී කන්ඩායම් විසින් වර්ගෝත්තමවාදී උද්ඝෝෂන උත්සන්න කෙරෙමින් පවත්නා තතු යටතේ ය. මෙම කන්ඩායම්වලට පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) ප්‍රධාන කොටස්කරුවකු වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ දක්ෂිනාංශික බෞද්ධ භික්ෂූන් විසින් මෙහෙයවෙන ජාතික හෙල උරුමය ඇතුලත් ය. මෙම කන්ඩායම් පිලිබඳ සිවරාම්ගේ විවේචන හේතු කොට ගෙන ඔහු ඔවුන්ගේ අවලාද ව්‍යාපාරවල විශේෂ ඉලක්කයක් බවට පත් විය.

සුනාමි ආධාර බෙදීම සඳහා එල්ටීටීඊය සමග ඒකාබද්ධ යාන්ත්‍රනයක් ගොඩනැගීමට ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග දරන ප්‍රයත්නයන් ජවිපෙ හා හෙල උරුමයේ ඉලක්කයන්ට ලක්ව ඇත. කන්ඩායම් දෙකම ප්‍රකාශ කරන්නේ, එවන් යාන්ත්‍රනයක් එල්ටීටීඊයට නීතියුක්ති භාවයක් ලබා දී වෙනම දෙමල රාජ්‍යයක් ගොඩනැගීම පිනිස එල්ටීටීඊයට මාවත සකසා දෙන බව යි. යථාර්ථය වන්නේ, ජවිපෙ හා හෙල උරුමය එල්ටීටීඊයට දෙන ඕනෑම සහනයක් රාජ්‍ය-ද්‍රෝහී ක්‍රියාවකට සම දෙයක් ලෙස සලකන අතර සමස්ත "සාම ක්‍රියාදාමයටම" ගැඹුරින් ම සතුරුව සිටින බවයි.

ජවිපෙ පෙරමුනු සංවිධානයක් වන දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය විසින් මෑතක දී සංවිධානය කරන ලද රැස්වීමක දී, කතිකයෝ, විවිධ ආන්ඩු නොවන සංවිධාන (එන්ජීඕ) බටහිර රටවල "කුලී ඒජන්තයන්" ලෙස ද සමහර සංවිධාන එල්ටීටීඊයට සහයෝගය දෙන "ද්‍රෝහීන්" ලෙස ද හංවඩු ගැසූහ. සිවරාම් "කොටියකු" ලෙස විශේෂයෙන් ම හෙලා දැකීමට ලක් විය.

හෙල උරුමය නිකුත් කල උමතු සහගත ප්‍රකාශයක් මෙසේ සඳහන් කරමින් පසුගිය සතියේ ඝාතනයට ආචාරය පුද කලේ යː "සිවරාම්ගේ මරනය සියලු අන්තවාදීන්ට අනතුරු ඇඟවීමකි. . . . ටැමිල්නෙට් සංස්කාරකගේ ඉරනම අනාගතයේ දි රටට එරෙහි වන සියල්ලන්ට ම අනතුරු අඟවන නිදසුනකි." එම ප්‍රකාශය සමාප්ත වන්නේ, "රටේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කිරීමට උපරිම බලය පාවිච්චි කරනු පිනිස සන්නද්ධ හමුදාවන්ට සහ සෙසු සේවාවන්ට පවතින සියලු බාධ ඉවත් කරන" ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටිමින්, අවි ගැනීම සඳහා කෙරුනු කැඳවුමකිනි.

මෙම අපරාධය කලේ කවුරුන් වුවත්, සිවරාම්ගේ ඝාතනයේ පැහැදිලි එල්ලයක් වූයේ වර්ගෝත්තමවාදී ගැටුම් ඇවිලවීම සහ එල්ටීටීඊය වෙතින් ප්‍රතිචාරයක් අවුලුවාගැනිම යි. අප්‍රේල් 30 දා නිකුත් කෙරුනු එල්ටීටීඊ නිවේදනයක් මෙසේ ප්‍රකාශ කලේ යː "ආරක්ෂක හමුදාවන් සමග සහයෝගීව ක්‍රියා කරන ශ්‍රී ලංකා මිලිටරි ඔත්තු අංශ සහ පැරා-මිලිටරි කොටස් මෙම ඝාතනය සම්බන්ධයෙන් වගකිව යුතු ය." එය සිවරාම්ට "මාමනිදර්" යන නාමය ප්‍රදානය කලේ ය. එය වනාහි ගෞරවය පුද කිරීමක් මෙන් ම එල්ටීටීඊය ඔහුගේ ඝාතනය සැහැල්ලුවෙන් නොගන්නා බවට කෙරුනු අනතුරු ඇඟවීමක් ද වේ.

දිවයිනේ නැගෙනහිර ප්‍රදේශවල දී, 2002 පෙබරවාරි සටන් විරාම ගිවිසුම දැනටමත් මුලුමනින් ම පාහේ අවලංගු ලියවිල්ලක් බවට පත්ව ඇත. එල්ටීටීඊයත් වී. මුරලිදරන් හෙවත් කරුනාගේ නායකත්වයෙන් යුත් එයින් බිඳුනු කන්ඩායමකුත් අතර ගැටුම් දිගට ම පවතී. ඊනියා සාම ක්‍රියාදාමයට සතුරුව සිටින සන්නද්ධ හමුදාවන්ගේ කොටස්වල පිටුබලය කරුනා කන්ඩායමට ලැබේ. දෙපාර්ශ්වය ම ඝාතනවල හා රැක සිට එල්ල කරන ප්‍රහාරවල යෙදී ගනිති. එම තතු පූර්න පරිමාන සිවිල් යුද්ධයක් කරා යලි ඇද වැටීමේ සැබෑ අන්තරාය මතු කරයි.

සාම සාකච්ඡා ඉදිරියට ගෙන යන ලෙස මහ බලවතුන් හා ව්‍යාපාරිකයන් වෙතින් එල්ල වන පීඩනයට එජනිස ආන්ඩුව මුහුන දී සිටී. ආන්ඩුව පසුගිය සතියේ දී සිවරාම්ගේ ඝාතනය හෙලා දකින ප්‍රකාශයක් නිකුත් කලේ ය. එහෙත් සභාගය තුල ගැඹුරු භේද මතු වී ඇති අතර, ඒකාබද්ධ සුනාමි සහනාධාර මන්ඩලයක් ගොඩනැගීමේ ප්‍රයත්නයන්, ජවිපෙ විරුද්ධත්වය හේතු කොට ගෙන, මාස ගනනාවක් තිස්සේ එක තැන හිර වී පවතී. කුමාරතුංගගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ජවිපෙ මෙන් ම සිංහල ස්වෝත්තමවාදය තුල ගිලී සිටින අතර, එබැවින් සිය සගයාගේ සහයෝගය අහිමි වී යාම ගැන දෙගිඩියාවෙන් පසු වේ.

මෙම දේශපාලන වාතාවරනය තුල, සිවරාම්ගේ ඝාතනය සැලසුම් කොට ක්‍රියාවට දැමූ අය සොයා ගෙන ඔවුන්ට විරුද්ධව නීති මගින් ක්‍රියා කිරීමට පොලීසිය සමත් වීමෙහි ඉඩකඩ අතිශයින් ම විරල ය.

© www.wsws.org